සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 33 S |
|---|---|---|

**ඉතිහාසය I - කොටස** කාලය පැය දෙකයි

නම ...............................................

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.

✹ අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන මත ලියන්න.

01. දික්සඳ සෙනෙවියා පිරිවෙන්වාසී මහානාම හිමි විසින් ..........................................රචනා කරන ලදී. (බෝධිවංශය,මහාවංශය, දීපවංශය)

02. ශ්‍රී ලංකාවේ අකුරු ලිවීම ගැන අවුරුදු ....................................... පමණ ඉතිහාසයක් තිබේ. (දෙදහස් පන්සීයක, දෙදහස් තුන්සීයක, දෙදහස් දෙසීය පනහක)

03. මුස්ලිම්වරු ......................................... ක්‍රමයට අනුව තම ආගමික උත්සව පැවැත්වීමේදී කාලය නියම කර ගනී. (ශත වර්ෂ, හිජ්රා වර්ෂ, ක්‍රිස්තු වර්ෂ)

04. ගුරුගල් ඇටසැකිලිමත ආලේපකර අවමංගල්‍ය චාරිත්‍ර ඉටුකළේ ....................................... යුගයේදීය (නවශිලා, මධ්‍ය ශිලා, පුරාශිලා)

05. මිනිසාට තිබෙන නොයෙක් නොයෙක් දෑ තැනීමේ හැකියාව .................................. ලෙස හැඳින්විය හැකිය. (භාෂාව, කලාව, තාක්ෂණය)

✹ අංක 6-10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

06. පෘථිවිය සෑදී අවසන් වූ පසු එහි නිර්මාණය වූ ජීවයක් සහිත පළමු දෙය බැක්ටීරියාවකි (.................)

07. ලෝකයේ මුල්ම ජීවීන් බිහි වූයේ ගොඩබිමේය. (.................)

08. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇතිකළ පළමු වානරයා ඔස්ට්‍රලොපිතිකස්ය (.................)

09. පුරාශිලා යුගය අවසාන වන විට මිනිසා චිත්‍ර ඇඳීමටත් ගල් වලින් රූප සකස් කිරීමටත් දැන සිටියහ. (.................)

10. ලෝකයේ වී වගාව මුලින්ම ආරම්භ වූයේ මධ්‍යම මෙක්සිකෝ ප්‍රදේශයේය. (.................)

✹ අංක 11-15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

11. පහත මූලාශ්‍ර අතරින් ඔබේ පාසලේ ඉතිහාසය හැදෑරීමට උදව්කරගත හැකි වඩාත් උචිත ලිඛිත මූලාශ්‍රය කුමක්ද?

1. නාමලේඛනය  2. ලොග්පොත  3. පාසල් සඟරා  4. ඇතුළත් කිරීමේ ලේඛනය

12. ක්‍රිස්තු වර්ෂ 2019 වර්ෂය බුද්ධ වර්ෂ වලින් දැක් වු විට ලැබෙන නිවැරදි පිළිතුර පහත දැක්වෙන පිළිතුරු අතරින් තෝරන්න.

1. බු.ව. 2500  2. බු.ව. 2560  3. බු.ව. 2562  4. බු.ව. 2563

13. මානව පරිණාමයේදී හැකි මිනිසා ලෙස විරුදාවලිය ලද මානවයා කවුද?

1. හෝමෝ ඉරෙක්ටස් 2. හෝමෝ හැබිලස්
3. හෝමෝ සේපියන් 4. හෝමෝ නියැන්ඩර්තාලෙන්සිස්

14. පින්තූරයෙන් දැක්වෙන්නේ මැටියෙන් කළ දෑකැත්තකි.

එය අයත් වන්නේ කුමන යුගයටද



1. පූර්ව ශිලා යුගය
2. පේලියෝසොයික යුගය
3. නව ශිලා යුගය
4. මධ්‍ය ශිලා යුගය

15. නීග්‍රොයිඩ් යනුවෙන් හැඳින්වූයේ ලෝකයේ කුමන ප්‍රදේශ වලට ව්‍යාප්ත වූ හෝමෝ සේපියන් වරුද?

1. අප්‍රිකාවට 2. ආසියාවට 3. චීනයට 4. ජපානයට

✹ **16-20 දක්වා ප්‍රශ්න වල A තීරුවට ගැලපෙන පිළිතුරු B තීරුවෙන් තෝරා යා කරන්න.**

| A | B |
| --- | --- |
| 16. පළමු වරට ගින්දර සොයා ගැනීම සිදුකළ රට | A ලෝහ |
| 17. මියගිය නෑදෑයින් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම | B ගුරුගල් |
| 18. සාරවත් දේ නිපදවූ මානවයා | C පූර්ව ශිලා යුගය |
| 19. වර්ණ සෑදීමට භාවිතා කළ ද්‍රව්‍යයකි | D හෝමෝ සේපියන් |
| 20. ගල් මෙවලම් වෙනුවට භාවිතා කළ මෙවලම් | E ඊශ්‍රායලය |
| | F හෝමෝ ඉරෙක්ටස් |

# II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 ට පිළිතුරු සපයන්න.**

01. i. පහත සඳහන් මූලාශ්‍ර අතරින් පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වලට අයත් වන මූලාශ්‍ර වර්ග 4 ක් තෝරන්න.

A පැරණි පොත්පත්

B ගොඩනැගිලි

C ජනකතා

D පැරණි භාණ්ඩ

E මිනිස් ඇට සැකිලි

F මිනිසා ආහාරයට ගෙන ඉතිරි වූ දෑ (ල.4)

ii. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් සිදු වූ කාලයන් ක්‍රි: වර්ෂ වලින් ලබා දී ඇත. ඒවාට අදාල වර්ෂ වරහන් තුළින් තෝරා බු: වර්ෂ වලින් ලියන්න.

(බු.ව. 818, බු:ව. 622, බු.ව. 511, බු.ව. 2492)

| | සිදුවීම | ක්‍රි : ව: | බු. ව. |
|---|---|---|---|
| **A** | මහසෙන් රජුගේ රාජ්‍ය කාලය ආරම්භවීම | ක්‍රි : ව: 274 | ............................ |
| **B** | වසභ රජුගේ රාජ්‍ය කාලය ආරම්භවීම | ක්‍රි : ව: 67 | ............................ |
| **C** | ශ්‍රී ලංකාවට නිදහස ලැබීම | ක්‍රි : ව: 1948 | ............................ |
| **D** | ශක වර්ෂ වල ආරම්භය සිදුවීම | ක්‍රි : ව: 78 | ............................ |

(ල. 4)

iii. පෘථිවියේ ජීවය ඇතිවීම පිළිබඳ පහත ප්‍රකාශ කියවා ගැලපෙන ප්‍රකාශ යුගල යා කරන්න.

1. පෘථිවිය දූවිලි වලාවකින් නිර්මාණය වීම — A ඔපබිනියා
2. ආහාර ගැනීමට මුඛයක් සහ ඇස් පහක් තිබීම — B සිලූරියන්
3. ගොඩබිම පළමුවරට හැකරුල්ලන් වැනි සතුන් බිහිවූ යුගය — C පේලියෝ සොයික
4. ගොඩබිම ශාක බිහි වූ යුගය — D නිහාරිකාවන් (ල. 4)

iv. A පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද?

B මෙම සළකුණ සොයාගත් රට කුමක්ද?

C මෙම සතා ජීවත් වූවා යැයි සැලකෙන්නේ කුමන ස්ථානයකද?

D මෙම සතාගේ ශරීර ලක්‍ෂණයක් ලියන්න.



(ල. 4)

02. මිනිසාට තිබු පහත සඳහන් හැකියා හැඳින් වූ ආකාරය එම හැකියා ඉදිරියෙන් ලියා දක්වන්න.

i. A අදහස් හුවමාරු කිරීම ....................................................

B නැටීම, ගැයීම වැනි සෞන්දර්යාත්මක ක්‍රියා .......................... (ල. 2)

ii. ගින්දර භාවිතයට හුරුවීමත් සමග මිනිසා ලබාගත් ප්‍රයෝජන 3 ක් දක්වන්න.

✠ ...................................... ✠...................................... ✠......................................

iii. පින්තූරය ඇසුරින් පිළිතුරු සපයන්න.



(අ) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද? (ල. 2)

(ආ) මෙය කුමන යුගයක පිහිටුවන ලද්දක්ද? (ල. 2)

(ඇ) මෙය නිර්මාණය කළේ කුමන ද්‍රව්‍යයකින්ද? (ල. 2)

(2x3=6)

03. i. පහත සඳහන් ප්‍රකාශ අතරින් පූර්වශිලා යුගයට අයත් අංග 2 ක් තෝරා ලියන්න.

A මිනිසුන් කණ්ඩායම් ලෙස එළිමහනේ ජීවත් වීම

B එක් තැනක දිගුකාලයක් ජීවත් වීමට හුරුවීම

C ගොවිතැනට පුරුදු වීම

D මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම (ල 2)

ii. මධ්‍ය ශිලා යුගයේ මිනිසුන් පහත සඳහන් ක්‍රියාකාරකම් කිරීමට යෙදූ ශිල්පක්‍රම අදාළ ක්‍රියාකාරකම් ඉදිරියෙන් ලියන්න.

| | ක්‍රියාකාරකම | ශිල්ප ක්‍රමය |
|---|---|---|
| A | ආහාර සපයා ගැනීම | .................................. |
| B | නිවාස තැනීම | .................................. |
| C | චිත්‍ර නිර්මාණය | .................................. |

(ල - 3)

iii. නව ශිලා යුගය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A නව ශිලා යුගයේ මිනිසා ගල් මෙවලම් වෙනුවට භාවිතා කළ මෙවලම් නම් කරන්න. ................................... (ල - 2)

B එකතැන ජීවත් වීමට හුරුවීම නිසා බිහි වූ දෙයක් නම් කරන්න. ............................................... (ල - 2)

C සතුන්ගේ ආරක්ෂාව සඳහා කළ දෙයක් ලියන්න. (ල - 2)

(ල.2 x 3=6)

04. i. පහත සඳහන් ධාන්‍ය මුල්වරට වගා කළ ප්‍රදේශ සඳහන් කරන්න.

| ධාන්‍ය වර්ගය | වගාකළ ප්‍රදේශය |
|---|---|
| බඩ ඉරිඟු | .................................. |
| තිරිඟු | .................................. |
| වී | .................................. |

(ල.3)


ii. මිනිසා ගොවිතැනට හුරු වීම නිසා ඇති වූ වෙනස්කම් 2 ක් ලියන්න. (ල - 2)

iii. ගොවිතැන් කළ මිනිසා අස්වැන්න නෙලා ගත් පසු ගත කළ විවේක කාලයේදි කළ කාර්යයන් 3 ක් ලියන්න.

(ල. 3x2=6)

05. i. හෝමෝ සේපියන් මානවයා විවිධ රටවලට ව්‍යාප්ත වීමේදී විවිධ හැඩරුව ගන්නා ලදී.

පහත සඳහන් ලෝක සිතියම හා මානව වර්ගවල පින්තූර උදව් කරගෙන ඔවුන් ව්‍යාප්ත වූ රටවල් ඊතල මඟින් සම්බන්ධ කරන්න.






කොකසොයිඩ්



නීග්‍රොයිඩ්




ඔස්ට්‍රලොයිඩ්



මොන්ගොලොඩ් (ල. 4)

ii. පහත සඳහන් වන්නේ ජලයේ බිහි වූ ජීවීන් ගොඩබිමේදී විවිධ සතුන් ලෙස වර්ධනය වූ ආකාරයයි. එම සත්ව වර්ග අදාළ පින්තූර වලට ගැලපෙන පරිදි යා කරන්න.

| |
|---|
| පක්ෂීන් |
| උරගයන් |
| මත්ස්‍යයන් |
| කෘමීන් |
| පණුවන් |
| උභය ජීවීන් |
| ක්ෂිර පායින් |




(ල - 7)

06. i. පෘථිවියේ මහා හිමයුගය අවසන් වීම නිසා ගොවිතැනට හුරුවීමට පටන්ගත්තේ හෙලෝසීන යුගයේය. මේ යුගයේ සිදු වු වෙනස්කම් 3 ක් ලියන්න. (ල=3)


ii. මුල්කාලයේ ඉදිකළ ගෙවල් හැඳින්වූයේ වරිච්චි ගෙවල් ලෙසය. එම ගෙවල් වල ලක්ෂණ 2 ක් ලියන්න. (ල=4)

iii. පින්තූරයේ දැක්වෙන්නේ මිනිසා නිර්මාණය කළ තාවකාලික පැල්පතකි.

(අ) මෙය නිර්මාණය කළ යුගය කුමක්ද? (ල=2)

(ආ) එය නිර්මාණය කළේ කුමන ද්‍රව්‍ය වලින්ද? (ල=2)






07. i. දෙන ලද හරස්පද උපයෝගි කරගෙන පින්තූර ප්‍රහේලිකාව පුරවන්න.

හරහට :-
1. සාරවත් දේ නිපද වු මානවයා
2. ගින්දර නිපද වු මානවයා
3. මොහු විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස තැනවීය

පහළට :-
1. ගලකින් ගලකට ගසා පතුරක් කඩාගෙන ගල් මෙවලම් සැදූ මානවයා
2. මිනිසෙකු වීමට නැඹුරුවක් ඇති කළ පැරණිතම වානරයා

ii. පහත සඳහන් හැකියාවන් තිබු මානවයන් දෙදෙනා නම් කර එම නම් ඉදිරියෙන් ඔවුන්ගේ හැකියා ලියා දක්වන්න.

a. අදහස් හුවමාරු කිරීමට භාෂාව භාවිතා කිරීම

b. හැඟීම් ප්‍රකාශයට සංගීතය, චිත්‍ර, නැටුම් වැනි ක්‍රියාවල යෙදීම

c. දඩයක්කාරයකු වීම (ල - 6)

**පළමු වාර පරීක්ෂණය - 2019**
**6 ශ්‍රේණිය - ඉතිහාසය**
**පිළිතුරු පත්‍රය**

## I - කොටස

| | | | |
|---|---|---|---|
| 1. මහාවංශය | 2. දෙදහස් දෙසිය පනහක | 3. හිජ්රා වර්ෂ | 4.පුරාශිලා |
| 5. තාක්ෂණය | 6. ✓ | 7. × | 8. ✓ |
| 9. ✓ | 10. × | 11. 2 | 12. 4 |
| 13. 2 | 14. 3 | 15. අප්‍රිකාවට | 16.E |
| 17. C | 18. D | 19. B | 20.A ලකුණු පිරිනැමීම 20×2 - 40 |

## II - කොටස

1. I. B, D, E, F - (ල-4)
   ii. A බු. ව. 818 B බු.ව. 611 C බු.ව. 2492 D බු.ව. 622 (ල-4)
   iii. 1 - D 2 - A 3 - B 4 - C (ල-4)
   iv. A ඔපබීනියාගේ පාෂාණි භූත සළකුණක් B කැනඩාව
   C මුහුදු පතුලේය D සෙන්ටි මීටර් 4 - 7 දක්වා දිගයි
   ආහාර ගැනීමට මුඛයක් තිබීම
   ඇස් පහක් පිහිටා තිබීම (ල-4)

02. i. A - සන්නිවේදනය B - කලාව (ල-2)
   ii. ආහාර පුලුස්සා ගැනීමට හැකිවීම
   ශීත කාලවලට උණුසුම් වීමට හැකිවීම
   ජීවිතය තවදුරටත් සුවපහසු විය. (ල-3)
   iii. (අ) කාන්තා රූපයක් (ල-2) (ආ)පූර්ව ශිලා යුගයේ පසු භාගයේ (ල-2)
   (ඇ) සත්ව ඇට කැබැල්ලකින් (ල-2)

03. i. A මිනිසුන් කණ්ඩායම් ලෙස එළිමහනේ ජීවත් වීම
   D මළගිය ඥාතීන් වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම (ල-2)
   ii. A ආහාර සපයා ගැනීම - දඩයමින් හා ආහාර එකතු කරමින්
   B නිවාස තැනීම - දැව දඬු හා කොළ අතු
   C චිත්‍ර නිර්මාණය - නොයෙක් වර්ණ යොදාගෙන ගල් පර්වත බිත්ති මත චිත්‍ර ඇඳීම (ල-3)
   iii. A - ලෝහ මෙවලම් (ල-2) B - ගම්මාන බිහිවීම (ල-2) C - දෙවියන් ඇදහීම (ල-2)

04. i. බඩ ඉරිඟු - මධ්‍යම මෙක්සිකෝව තිරිඟු - මද්‍යධරණි ප්‍රදේශ වී - චීනය (ල-3)
   ii. ● පවුලේ සාමාජිකයන් සමඟ එකතැනක ජීවත්වීමට සිදුවීම හා ඒ නිසා නිවාස හා ගම්මාන බිහි වීම
   ● ගොවිතැන ආරම්භ වීම නිසා ආහාරය සඳහා සුදුසු ධාන්‍ය හඳුනාගැනීමට හා බෝ කිරීමට උත්සාහ ගැනීම (ල-2)
   iii. ● චිත්‍ර ඇඳීම ● පිළිම සෑදීම ● සංගීතයට යොමු වීම. (ල-3×2)

05. i. කොකසොයිඩ් ඊතලයකින් A අක්ෂරයට යා කළ යුතුයි
   නීග්‍රොයිඩ් ඊතලයකින් B අක්ෂරයට යා කළ යුතුයි
   ඔස්ට්‍රලොයිඩ් ඊතලයකින් C අක්ෂරයට යා කළ යුතුයි (ල - 4)
   ii. පක්ෂීන් - 4 උරගයින් - 5 මත්ස්‍යයන් - 7 කෘමීන් - 6
   පණුවන් - 1 උභයජීවීන් - 2 ක්ෂීර පායින් - 3 (ල - 7)

06. i. දඩයම් කිරීම වෙනුවට ගොවිතැන් කිරීම
   ලෝහ වර්ග සොයාගෙන තමන්ගේ ප්‍රයෝජනයට ගැනීම
   සතුන් දඩයම් කිරීම වෙනුවට හීලෑ කිරීම (ල - 3) ii.මැටියෙන් සාදන ලද බිත්ති
   කොළ අතු සෙවිලි කළ වහල (ල .2×2 = 4)
   iii. (අ) මධ්‍ය ශිලා යුගය (ල - 2)
   (ආ) ලී දඬු හා කොළ අතු සෙවිලි කොට (ල - 2)

07. i. <u>හරහට</u> 1. හෝමෝ සේපියන්
   2. හෝමෝ ඉරෙක්ටස් 3. හෝමෝ නියැන්ඩර් තාලෙන්සීන්
   <u>පහළට</u>
   1. හෝමෝ හැබිලස් 2. ඔස්ට්‍රලෝපිතිකස් (ල - 5)
   ii. a. හෝමෝ සේපියන් b හෝමෝ සේපියන් c හෝමෝ නියැන්ඩර් තාලෙන්සීස් (ල - 3×2 = 6)